# පශ්චාත් උපාධි වෛද්‍ය විද්‍යා ආයතනය

# කොළඹ විශ්වවිද්‍යාලය

# ඇබෑර්තු

කොළඹ විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි වෛද්‍ය විද්‍යා ආයතනයේ පවතින පහත සඳහන් ඇබෑර්තුව සඳහා සුදුසුකම් සපුරාලන පුද්ගලයින් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

තනතුර සඳහා වන අයදුම්පත 2025.06.03 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන පරිදි **"ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/ ආයතන හා සාමාන්‍ය පරිපාලන, පශ්චාත් උපාධි වෛද්‍ය විද්‍යා ආයතනය, අංක 160, මහාචාර්ය නන්දදාස කෝදාගොඩ මාවත, කොළඹ 07"** යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් හෝ **recruitment@pgim.cmb.ac.lk** යන ඊමේල් ලිපිනයට එවිය යුතුය. අයදුම්පත බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ හෝ ඊමේල් විෂය තීරයේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

අයදුම්පත හා වැඩිදුර තොරතුරු පශ්චාත් උපාධි වෛද්‍ය විද්‍යා ආයතනයේ වෙබ් අඩවියෙන් (**https://pgim.cmb.ac.lk**) වෙතින් ලබාගත හැකිය. නිශ්චිත ආකෘති මගින් ඉදිරිපත් කරන අයදුම්පත් පමණක් සලකා බලනු ලැබේ.

අසම්පූර්ණ අයදුම්පත් හා සුදුසුකම් හා පළපුරුද්ද සත්‍යාපනය කිරීමේ සහතිකවල ඡායා පිටපත් ඇතුළු අවශ්‍ය විස්තර ඇතුළත්කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ප්‍රමාදව ඉදිරිපත් කරන අයදුම්පත් භාර නොගන්නා අතර, ප්‍රතික්ෂේප කරන ලද අයදුම්පත් කිසිදු හේතුවක් යටතේ සලකා බලනු නොලැබේ.

01. තාක්ෂණ (කාර්මික) නිලධාරී තනතුර (යාන්ත්‍රික) (III වන ශ්‍රේණිය)

**සුදුසුකම් :**

(I) භෞතික විද්‍යා ධාරාවේ එක් වාරයකදී අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ විෂයන් තුනකින් (03) සමත් වී තිබීම.

**සමග**

(II) තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික/ වෘත්තීය ආයතනයක් හෝ යාන්ත්‍රික ඉංජිනේරු/ හෝ සමාන ක්ෂේත්‍රයක පිළිගත් ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම 5ට නොඅඩු නිපුණතා සහතිකයක් ලබා තිබීම.

**වයස :** අවුරුදු 18ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 45ට වැඩි නොවිය යුතුය.

**තෝරාගැනීම :** ලිඛිත හා /හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි

**වැටුප් පරිමාණය :** (U MT 1 (III)) 2025.04.01 දින සිට 2025.01.01 දිනට රු. 51,095-7X540-10X640- 60,575 මාසිකව

**සැ.යු :** ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

**අධ්‍යක්ෂ,**
**පශ්චාත් උපාධි වෛද්‍ය විද්‍යා ආයතනය,**
**අංක 160, මහාචාර්ය නන්දදාස කෝදාගොඩ මාවත, කොළඹ 07.**
**2025.05.05**